

ස්ථානය-මිතුරෙකු ගේ නිවසක්
දිනය-සෙනසුරාදා
කාලය-සුන්දර සැන්දෑ යාමය, සවස අටට පමණ
අවස්ථාව-සුහද සාදයක්

වැඩි විස්තර මෙසේ ය.

මිතුරු සමාගම තරම් වෙනත් සුහද සමාගමක් ලොවෙත් නැත!
ඕනෑම සමාජයක මිතුරු මිතුරියන් එක් වී විනෝදවීම සාමාන්‍ය දෙයකි. විශේෂයෙන් ඕස්ට්‍රේලියාව වැනි රටවල ජීවත්වෙන අයගෙන් අප වැනි සංක්‍රමණිකයින් බොහෝ දෙනෙකුට තමන් ගේ ඥාතීන් වෙනුවට ද දුක සැප බෙදා ගැනුමට ඉන්නේ ද මිතුරන් ය. තමන් ගේ, තම දරුවන් ගේ උපන් දින හෝ අනෙකුත් විශේෂ අවස්ථා සමරන්නට මිතුරන්ට ද ආරාධනා කර සාද පවත්වන්නන් බොහෝ ය. එසේම, දුර පළාතක වෙසෙන දන්නා හඳුනන අයෙකු තම ප්‍රදේශයට පැමිණි විට, අන්‍යෝන්‍ය මිතුරන් කැඳවා සාදයක් පැවැත්වීම ද සාමාන්‍ය දෙයකි. ඊට සාමාන්‍යයෙන් සින්දු වතුර පානය කරන ලාංකික කාන්තා පක්ෂය ඉතා සුළුතරයකි. ඔවුන් ප්‍රිය කරන්නේ සුදු පැහැති වයින් වැනි සින්දු වතුර වර්ගවලටයි. මේවා ප්‍රනීත රසයකින් යුක්ත වේ. පලතුරු යුෂ මුසු කළ සැර අඩු වොඩ්කා හෝ අඩුතරමින් බියර් හෝ බොන ලාංකික කාන්තාවන් මා දැක නැති තරම් ය. සමහර විට මට මුණ ගැසෙන කාන්තාවන් ගේ වයසට අඩු වයස් සීමාවල එවැන්නියන් සිටිනවා විය හැක.

පිරිමින් බොහෝ දෙනා ප්‍රිය කරන්නේ විවිධ විස්කි වර්ග පානයටයි. නැතිනම්, වොඩ්කා වැනි වෙනත් සැර වැඩි සින්දු වතුර වර්ග ද, අවස්ථානුකූලව රතු (හෝ ඇතැම් විට සුදු) වයින් බොන්නෝ ද සිටිති. බියර් නම් බොහෝ විට අලෙවි වෙන්නේ දිවා කාලයේ පැවැත්වෙන බාබකියු සාදවලදී ය. නමුත් දිවා රෑ නොබලා බියර් ම බොන්නෝ ද කිහිප දෙනෙකු හෝ සිටිති.

# අයෑම් එ බුඩිස්ට්, අයි ඩොන්ට් ඩ්‍රින්ක්, තෑන්ක් යූ

අමතරව, කිසිදු නිශ්චිත හේතුවක් නොමැතිව වුව ද, විටින් විට තම මිතුරන් නිවසට කැඳවා බතින්-බුලතින් සංග්‍ර කරන්නනෝ ද බොහෝ සිටිති.

ඔතන බතින් යැයි කීම බොහෝ අවස්ථාවල දී නිවරැදි වුව ද, බුලතින් කියා කීම නම් කිසිසේත් ම නිවැරදි නොවේ. බුලත් කොළ නම් බේතකට හේතකට අවශ්‍ය වූවහොත් සොයා ගත හැකි වුණත්, බුලත් කන්නන් නම් දැන් අපේ වයසේ අය අතර විරල ය. එනිසා බුලතින් සංග්‍රහ මා වෙසෙන ඕස්ට්‍රේලියාවේ නම් ඇත්තේ ම නැතැයි සිතේ.

## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

ඒ වෙනුවට, ඒ යුග පදයේ දෙවන කොටස විය යුත්තේ සින්දු වතුර යන්නයි. එනම්, මෙහි නිවරැදි යෙදුම බතින්-සින්දු වතුරෙන් සංග්‍රහ කිරීම වේ. සින්දු වතුර කියන්නේ කුමකට ද යන්නත්, ඒ නම යෙදීමට හේතුව කුමක්දැයි යන්නත් දන්නෝ දනිති! ඇතැම් සාදවල දී ඇතැමුන්ට මේ සින්දු වතුර වෙනුවට වාද වතුර හෝ පණ්ඩිත වතුර හෝ පෙවී තිබෙනු දක්නට ලැබේ. එය වෙනම විස්තරාත්මකව ලිවිය යුතු එක් කතාවකට නොව කතා මාලාවකට ම සුදුසු ප්‍රස්තුතයකි.

ඒ කෙසේ වෙතත්, මිතුරු සමාගම පිණිස පවත්වනු ලබන සුහද සාදයක දී සින්දු වතුරෙන් සංග්‍රහ කිරීම සාමාන්‍ය සිරිතයි.

මා සහභාගී වී ඇති සහ අප විසින් සංවිධානය කර ඇති සාදවලදී සින්දු වතුර සම්බන්ධයෙන් මා නිරීක්ෂණය කර ඇති දේ මෙසේ ය.

එසේම, මා මෙතෙක් සහභාගී වී ඇති ශ්‍රී ලාංකික මිතුරු සමාගම් සුහද සාදවලට සහභාගී වූ අන් අයගෙන් අති බහුතරය බෞද්ධාගමිකයින් බව අමුතුවෙන් කිව යුතු නැත.

ඒ ආකාරයේ ම තවත් වැදගත් කාරණයක් වනුයේ බුදු දහමේ ඉගැන්වීම් සහ සින්දු වතුර පානය අතර ඇති නොගැලපීමයි.

අපේ බුද්ධාගම්කාරත්වය මැනීම සඳහා මා ඉදිරිපත් කළ පන්සිල් අනුසාරයෙන් සැකසුණු මිනුමට අනුවට සින්දු වතුර බී සුරාමේරය සිල් පදය කැඩුණු පසු වුවද, 80% ක බුද්ධාගම්කාරත්වය පවත්වා ගත හැකි වේ. එය බෞද්ධයෙකු ලෙස විශිෂ්ට සම්මානලාභී, පළමු පන්තියේ සාමාර්ථයකි.

සින්දු වතුර බීමේ ලොකු වරදක් නැති බව එයින් පෙනේ යැයි සිතේ.

දැන් නැවත කතාවට යමු.
මේ කියන සාදයට ආරාධනා ලැබ සිටියේ අඹු-සැමියන් ජෝඩු කිහිප දෙනෙකු පමණි. මුලින් නො-දන්නා අය එකිනෙකාට හඳුන්වා දීමත් සමග සතුටු සාමීචියකින් සාදය ඇරඹුණි.
ඉන්පසු එළැඹුණේ කෙටි කෑම සහ සින්දු වතුර පානය කිරීමේ අවස්ථාවයි. "මුලින් ම කාන්තාවන්ට සැලකිය යුතුය!" යන සුද්දා ගේ රීතිය අනුව, කාන්තා පක්ෂය සඳහා සුදු පැහැති වයින් පිරවූ දිදාල රැගෙන එන ලදී.

එක් කාන්තාවක් තමන් වෙත දිගු කෙරුණු මීවිත පිළිගත්තා ය.

ඊළඟට සිටි ඇත්තී එක්වරම කීවේ මෙයයි.
අයෑම් එ බුඩිස්ට්, අයි ඩොන්ට් ඩ්‍රින්ක් තෑන්ක් යූ!
එලෙස පැවසූ ඇය තමන් වෙත දිගු කෙරුණු මීවිත පිළි නොගත්තා ය.

ඒ සිද්ධිය ගැන ඇසූ විට මගේ සිතේ විශාල ප්‍රශ්නයක් පැන නැගිණි. ඒ කිසිසේත් ම දෙවෙනි කාන්තාව වයින් නොබීම ගැන නම් නොවේ. යමෙකු මත්පැන් පානය නොකරන්නේ නම්, එය අගය කළ යුත්තකි. ප්‍රශංසනීය කාරණයකි. ප්‍රශ්නය ඇති වූයේ ඈ කළ ඒ ප්‍රකාශයේ ය.

එක්කෝ "නෝ තෑන්ක් යූ!" හෝ නැතිනම්, "අයි ඩොන්ට් ඩ්‍රින්ක්, තෑන්ක් යූ!" හෝ පමණක් නොක-ියා එයට "අයෑම් එ බුඩිස්ට්" යනුවෙන් කෑල්ලක් එකතු කිරීමෙන් ඇය කළේ යම් අධිපතිවාදයක්, පුරාජේරුවක්, ලොකුකමක් ප්‍රදර්ශනය කිරීමක් බව මගේ අදහසයි.

මා එසේ කියන්නට හේතුව නම්, එතැන සිටි අනෙක් අය අති බහුතරය ද "අයෑම් එ බුඩිස්ට්"ලා ම වීමයි.

බුද්ධාගම්කාරත්වයක් නිසා යමෙකු රහමෙර පානය නොකරන්නේ නම්, එය සැමට ම පොදු තහනමක් විය යුතුය. එසේ තහනමක් ඇතැයි අන් බුද්ධාගම්කාරයින් සලකන්නේ නැති තැනක දී, එය ඉස්මතු කිරීමෙන් ලැබෙන්නේ පොඩි අධිපතිවාදී කික් එකක් මිස අන් කවර අමුතු පිනක් ද?

මේ ආකාරයටම, හරක් මස් නොකන එග්ටේරියන් ලා සහ චිකන්ටේරියන් ලා මෙන්ම කිසිදු මාංශයක් නො බුදින වෙජිටේරියන් ලා බොහෝ දෙනෙකු තමන් ගේ රුචිකත්වය අනුව තමන් ගේ පාඩුවේ තම එළවළු ජීවිත ගෙවූවද, ඒ අස්සේ, ඉතා ටික දෙනෙකු පමණක් මාංශ භක්ෂකයින්ට හැකි සෑම විටෙක ම පාහේ ඇනුම් පද කියනු මා දැක ඇත. ඉහත කී කාන්තාව ගේ "අයෑම් එ බුඩිස්ට්, අයි ඩෝන්ට් ඩ්‍රින්ක්" යන ප්‍රකාශය ද ඒ ආකාරයේ අධිපතිවාදී, මං සුදනා මොඩලයේ අන් අය හෙළා දකින ආකාරයේ ඇනුම් පදයක් බව කිව හැක. ඇයට ඇති එකම සමාවට කාරණය නම්, බෞද්ධ නොවන පිරිස් සහභාගී වෙන උත්සව අවස්ථාවලදී වයින් යනාදිය පිරිනැමෙන විට ඒවා ප්‍රතික්ෂේප කිරීමේ දී එයට හේතුව වැඩිදුර විස්තර කිරීම සඳහා ඇය නිතර යොදාගන්නට ඇති "අයෑම් එ බුඩිස්ට්" යන කියුම එදා ඇය සිටියේ අති බහුතර බෞද්ධයින් පිරිසක් මැද බව අමතකව ඇගේ කටින් නොදැනුවත්ව ම වාගේ පි-ටවුණා ය යන්නයි.

ප/ලි
අයෑම් එ කොලම්නිස්ට් ඉන් සන්නස, අයි ඩෝන්ට් ලයි!

# හෙළ කලාකෙත පෝෂණය කරන විශ්ව රංගායතනය

කමනි ධර්මරත්න
ශ්‍රී ලංකාව.

විශ්ව රංගායතනය යනු අප කවුරුත් හොඳින් දන්නා මෙලබන් වෙසෙන ශ්‍රී ලාංකික දූ දරුවන්ට නර්තනය පුහුණු කරවන ප්‍රසිද්ධ නර්තන පාසලකි. අද වන විටත් මෙහි අධ්‍යක්ෂිකා රශිකා කුලසිංහ මහත්මිය යටතේ විශාල දරුවින පිරිසක් නර්තන අභ්‍යාස පුරුදු පුහුණු වෙමින් සිටී.

සෑම වසර තුනකටම වරක් විශ්ම රංගායතනයේ දරුවන් ගුරුතුමිය සමග දෙමාපියන්ගේද නොමද සහයෝගය ඇතුලු ඉතා ඉහල සංස්කෘතික වටිනා-කමකින් යුතු නර්තන ප්‍රසංගයේ මෙල්බන් වාසී කලාකාමී සැම වෙත ගෙන එනු ලබයි. ''විශ්ව නර්තන රේඛා'' නමින් ඉදිරිපත් කරන මෙම ප්‍රසංග පෙළ 2005 වසරේ සිට මේ දක්වා සෑම වසර දෙක-කමට වරක් නොකඩවා පවත්වාගෙන පැමිණ ඇත.

මේ අතරින් මා සිත්ගත්, අප සිත්තුල නොමැකෙන සටහනක් තැබූ ''විජය කුවේණි'' ප්‍රසංගය, ලංකාවේදීද දැකගැනීමට ඉතා විරල අන්දමේ අගනා ඓතිහාසික වටිනාකමකින් යුතු ප්‍රසංගයකි. විජේය කුවේණි ප්‍රසංගය විශ්ව රංගායතනයේ දසවෙනි සංවත්සරය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නෙළුම් පොකුණ රඟහලේදී වේදිකාගත කරන විට එය නැරඹීමේ භාග්‍යය මටද හිමි විය. මෙහි නර්තනාංග හා උසස් බව මෙන්ම සිත්ගන්නා බව අදත් සිහිනයක් සේ මා මතකේ රැඳී පවතී. විජය කුවේණි ප්‍රසංගයේ සාර්ථකත්වයෙන්ම එය ඉදිරිපත් කළ විශ්ව රංගායතනයේ ගුරුතුමියගේ දක්ෂතාවයන් කොතෙක්දැයි හඳුනාගැනීමට මට හැකි විය. එවන් දක්ෂතා ඇති අයෙකු අතින් බිහිවන නර්තනයන්හි විශිෂ්ඨත්වය ගැන අටුවා ටීකා ලේවීමට අවශ්‍ය නොවේ.

අද ලංකාවේ නර්තනය අභාවයට යමින් පවතින වකවානුවක, ඕස්ට්‍රේලියාව වැනි රටකදී කලඑළි රංගනයක් වැනි කර්තව්‍යයක් සිදුවීම් ශ්මය ජනකය. අපේ පිරිහී යන නර්තන සම්ප්‍රදායන් ආරක්ෂා කර ගැනීමට අපේ නර්තනයන්ගේ ආ-භාෂය නව පරපුරේ දරුවිනට ලබාදීමට කැප-වෙන විශ්ව රංගායතනය වැනි ආයතන වලින් ලැබෙන පිටුවහල අපද ශ්‍රී ලාංකිකයන් ලෙස අගය කල යුතුය.

විශ්ව රංගායතනය තුල වසර දහයකට අධික කාලයක් පුරා ශිල්ප හැදෑරූ ශිල්පිනියන් සය-දෙනෙකු උදෙසා හිසවෙස් තැබීම නැතහොත්



පාහින්පත් තැබීමේ මංගල්‍යය අගෝස්තු මස 8 වන සඳුදා උදෑසන කීස්බරෝ ධම්මාරාම විහාරස්ථාන භූමියේදී සිදු කිරීමට නියමිතය.

මේ ශිල්පිණියන් රශිතා කුලසිංහ මහත්මිය යටතේ මනා පුහුණුවක් ලබන්නට ඇති බව මට සහතික කොට කිව හැක. අගෝස්තු මස 8 වන සඳුදා උදෑසන යෙදෙන සුභ මොහොතින් මෙම ශිලිප-නියන්ගේ හිසෙහි පාහන්පත පළඳවා ඔවුන් දොරට වැඩීමේ වැඩසටහන සිදුවේ. මේ අවස්ථාව දැක බලා ගැනීමට ලැබීමටද මෙල්බන්හි ශ්‍රී ලාංකිකයන්ට ලැබෙන භාග්‍යයකි.

මෙම ශිල්පිනියන් කලඑළි රංගනයෙන් වේදිකාව තුල දස්කම් පෙන්වන්නේ සැප්තැම්බර් මස 4 වන ඉරුදින සවස 6ට බර්ට්‍රඩ් බීයිං සෙන්ටර්හිදී පැවැත්වෙන ''නර්තනාභිෂේක'' ප්‍රසංගයෙනි. එදිනට මේ ශිල්පිනියන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නර්තනයේ අභිෂේක ලබනු ඇත. විශ්ව රංගායතනයේ සිසුවියන් දෙමාපියන් සහ රශිතා ගුරු මහත්මියත් මේ සියලුම කටයුතු ඉතා හොඳින් සිදුකර ගැනීමට කැපවෙමින් සිටී.

තවත් බොහෝ කාලයක් විදේශ රටක සිට හෝ අපේකම, අපේ සංස්කෘතිය, අපේ දරුවනට අවබෝධ කොට දී, ටිකින් ටික අප අතරින් මැකී යමින් පවතින අපේ සාම්ප්‍රදායික ද, කස්තිරම්, අඩව් ඇතුලත් අපේ අභිමානවත් නර්තනාංගයන් රැකගැනීමට දිරිය් ලැබේවායි රශිකා කුලසිංහ මහත්මියටත් ඇගේ සිසු කැලටත් මම සුභාසි-ංශනය කරමි.